## අ) රාජ්‍යයේ ස්වභාවය

### රාජ්‍යයේ නම

රාජ්‍යයේ නම "ශ්‍රී ලංකා ජනරජය" ලෙස සංශෝධනය කිරීම පිළිබඳව ද සලකා බලන මෙන් ඉල්ලා සිටිමු.

හේතුව:

ශ්‍රී ලංකා ජනරජය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ලෙස නාමකරණය කෙරුණේ 1978 ව්‍යවස්ථාව තුළිනි. එහි ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී යන විශේෂණය යොදන ලද්දේ ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදය (democratic socialism) හෙවත් සුබසාධක රාජ්‍යයක් බව පෙන්වනු පිණිස ය. රටක් අනුගමනය කරන ආර්ථික-සමාජ ප්‍රතිපත්තිය එහි නාමය තුළ පිලිබිඹු විය යුතු ම නැත. අනෙක් අතට මේ නාමය අනවශ්‍ය ලෙස දීර්ඝ වූ යෙදුමකි. එය යළි ශ්‍රී ලංකා ජනරජය ලෙස සංශෝධනය කිරීම පිළිබඳව සලකා බලන මෙන් ඉල්ලා සිටිමු.

### නිදහස් දිනය

ශ්‍රී ලංකාවේ නිදහස් දිනය ලෙස මැයි 22 දින සඳහන් කරන මෙන් ඉල්ලා සිටිමු.

හේතුව:

ශ්‍රී ලංකාවේ නිදහස් දිනය ලෙස වත්මන් ව්‍යවස්ථාවේ සඳහන් ව තිබෙන පෙබරවාරි 4 දින 1948 දී ඊනියා නිදහස ලබාගැනීමෙන් පසුව ද මෙරට බ්‍රිතාන්‍ය කිරීටයට යටත් රටක් විය. අග්‍රාණ්ඩුකාරවරයා පත්කෙරුණේ එරට රැජින විසිනි. මෙරට පුරවැසියකුට අභියාචනා කළ හැකි ඉහළ ම උසාවිය බ්‍රිතාන්‍යයේ ප්‍රිවි කවුන්සිලය විය. 1971 කැරැල්ලේ දී එම තරුණයන්ට විරුද්ධ ව නඩු පවරනු ලැබුවේ ද මහරැජිනියගේ රජයට එරෙහි ව කැරලි ගැසීමේ වරදට ය. ඇතැම් කරුණු සම්බන්ධයෙන් නීති පැනවීමට ලංකා පාර්ලිමේන්තුවට තිබූ බලය කෙරෙහි සැක ඇතිවන ආකාරයේ ප්‍රතිපාදන සෝල්බරි ව්‍යවස්ථාවේ විය. එම ව්‍යවස්ථාව ද අධිරාජ්‍යවාදීන් විසින් නිර්මාණය කර පටවන ලද්දක් විය. මේ සීමාවලින් සහ බැඳීම්ලින් මිදෙමින් අපි නෛතික ව අර්ථාන්විත වූ සැබෑ නිදහසක් ලබාගත්තේ 1972 සිදුකළ ව්‍යවස්ථා විප්ලවයෙනි. ඔවුන්ගේ පාර්ලිමේන්තුව ලෙසින් නො ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ලෙස රැස් ව විදේශ පාලනාධිකාරීන්ගේ බලයෙන් මිදෙමින් අපේ ම ව්‍යවස්ථාවක් නිර්මාණය කරගැනීමෙනි. ඒ නිසා අපේ නිදහස් දිනය ලෙස එම සැබෑ නිදහස ලබාගත් දිනය සටහන් කරන මෙන් ඉල්ලා සිටිමු. (තුනෙන් දෙකක බලයක් සහිත රජයනට ජනමත විචාරණය යනු බියවිය යුතු දෙයක් නොවේ. හැරත් එ මගින් නව ව්‍යවස්ථාවට වඩාත් සුජාතභාවයක් ලැබෙනු නො අනුමාන ය.)

**ආගම**

- Buddhism and the regulation of religion in the new constitution: Past debates, present challenges, and future options ’ මැයෙන් බෙන්ජමින් ස්කොන්තාල් සහ අසංග වැලිකලගේ කර්තෘත්වයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) පළ කළ ලියවිල්ල තුළ මේ කාරණය සම්බන්ධ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සම්පාදකයන් අවධානයට ගත යුතු කරුණු රැසක් සමග විග්‍රහයක් දක්වා ඇත. එය පරිශීලනය කරන මෙන් ඉල්ලා සිටිමු.

- වත්මන් ව්‍යවස්ථාවේ 9 වන වගන්තියේ හෝ එය ප්‍රතිස්ථාපනය කෙරෙන වෙනත් වගන්තියක සපයා ඇති "මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන (**while assuring the rights granted by...**) අතර බුද්ධශාසනය සුරක්ෂිත කර පෝෂණය කිරීම රජයේ වගකීම විය යුතු ය" යන වචන "සපයා ඇති මූලික අයිතිවාසිකම්වලට යටත් ව (it shall be the duty of the government to protect and foster Buddha Sasana, **subject to rights granted by...**) බුද්ධ ශාසනය සුරක්ෂිත කර පෝෂණය කළ යුතු ය" යන වචන මගින් ප්‍රතිස්ථාපන කිරීමට ආචාර්ය අසංග වැලිකල කරන යෝජනාව (බලන්න එම ලියවිල්ලේ 32 පිටුව) සලකා බලන ලෙස ද ඉල්ලමු.

නමුත් අපගේ පෞද්ගලික අදහස පහත පරිදි වේ.

- වත්මන් ව්‍යවස්ථාවේ පවතින 9 වන වගන්තියේ බුදුදහමට ඇති රාජ්‍යානුග්‍රහය සම්බන්ධ ව ප්‍රායෝගික බලපෑමක් ඇත්තේ එහි එන "බුදුදහම සුරක්ෂිත කර පෝෂණය කිරීම රජයේ වගකීමක් විය යුතු ය" යන වචන තුළ මිස බොහෝදෙනා වැදගත් යැයි සිතන "ශ්‍රී ලංකා රජය බුදුදහමට ප්‍රමුඛස්ථානය දෙනු ලබන්නේ ය" යන වචන තුළ නො වේ. ඒ නිසා බුදුදහම සුරක්ෂිත කර පෝෂණය කිරීම ශ්‍රී ලංකා රජයේ වගකීම බව ( වෙනත් කරුණු ද සමග) සඳහන් වන ඕනෑම විකල්ප වැකියක් විසින් දැනට බුදුදහම සම්බන්ධයෙන් පවතින තත්ත්වය ම කිසිම වෙනසක් නො වී පවතිනු ඇත. නමුත් වත්මන් තත්ත්වයට වෙනස් ව ලංකාවේ පවතින සෙසු ආගම් අදහන ජනතාව සම්බන්ධයෙන් වඩාත් අන්තර්ගෘහිත (inclusive) බවක් දක්වන භාෂාත්මක වෙනසක් තුළින් ශ්‍රී ලාංකීය හැඟීම ශක්තිමත් වන බව පැවසිය හැකි ය. ඒ අනුව මීට පෙර පත් කළ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාවේ වූ විකල්ප සූත්‍රණය සහ ආගම පිළිබඳ අතුරු කමිටුවේ ( උපුල් අබේරත්න; එම්.එල්.ඒ. කාදර්; ලාල් විජේනායක; සිරිමසිරි හපුආරච්චි; සුනිල් ජයරත්න විසින් ඉදිරිපත් කළ) තුන්වන විකල්ප යෝජනාව සහ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඒ. අසීස් මහතා ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳ ව ද සලකා බලන මෙන් ඉල්ලා සිටිමු.

  අප ආදර්ශවත් වසයෙන් හඳුනාගත් ඉහත යෝජනා අතරින් එක් යෝජනාවකින් ම වත්මන් නමවන වගන්තිය ප්‍රතිස්ථාපනය කළ යුතු නො වන මුත් මෙම ආදර්ශ යෝජනාවන් වෙතින් යම් ආභාෂයක් ලද හැකි ය. එමෙන් ම එම යෝජනාවන් වඩාත් අර්ථවත් කිරීම සඳහා ආචාර්ය අසංග වැලිකල යෝජනා කරන භාෂාත්මක වෙනස ද එම වැකිවල අදාල කොටස සම්බන්ධ ව යොදා ගත හැකි ය. එම යෝජනාවන් විසින් අනෙකුත් ආගම් කෙරෙහි සුරක්ෂිත සහ අභිමානවත් තත්ත්වයක් ඇතිකිරීමට ගත් ප්‍රවේශයන්හි සංයෝගයක් යොදාගත හැකි ය.

නිදසුන් වසයෙන් පහත දළ ප්‍රකාශය සැලකිය හැකි ය.

> ශ්‍රී ලංකා රජය බුදුදහම සහ බෞද්ධ සංස්කෘතිය විසින් කර ඇති ඓතිහාසික කාර්යභාරය සහ බෞද්ධ උරුමය පිළිගනිමින් සියලු ආගම් කෙරෙහි සමාන ව කටයුතු කරනු ලැබේ. ඒ අනුව බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, ඉස්ලාම් ඇතුලු සියලු ම ආගම්වලට ඔවුන්ගේ අයිතිවාසිකම් සහ උරුමයන් ආරක්ෂා කරදෙමින් එම සියලු ආගම් සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ කාර්යභාරය විය යුතු ය.

- එ මෙන් ම මෙම පරිච්ඡේදයේ නම හා පැතිසටහන රාජ්‍යය සහ ආගම/ආගම් යනුවෙන් වෙනස් කිරීම පිළිබඳ ව සලකා බලන ලෙස ද ඉල්ලා සිටිමු.

<u>විස්තර කිරීම (සංක්ෂිප්ත කිරීම සඳහා වෙන ම දක්වනු ලැබේ. කියවීම අත්‍යාවශ්‍ය නැත)</u>

1. පසුගිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාවේ විකල්ප සූත්‍රණය.

> ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් සියලු ආගම් හා විශ්වාසයන්ට ගෞරවයෙන් හා අභිමානයෙන් සලකමින් හා වෙන්කොට සැලකීමකින් තොර ව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සියලු ම පුද්ගලයන්ට සහතික කරමින්, බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය.

මෙහි ශ්‍රී ලංකා ජනරජය යන්න ශ්‍රී ලංකාව ලෙස වෙනස් කර ඇති අතර එය එම වාර්තාව විසින් මෙම වගන්තියට පමණක් කර ඇති වෙනසක් නොවේ. මෙම වගන්තිය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය යන්න හෝ බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කළ යුතු ය යන්න හෝ ඉවත් කර හෝ වෙනස් කර නැත. නමුත් ඒ වෙනුවට ඔවුන් අන් ආගම්වල අයිතිවාසිකම්ද ආරක්ෂා විය යුතු බව පවසන වැකියට, "සියලු ආගම් ආගම් හා විශ්වාසයන්ට ගෞරවයෙන් හා අභිමානයෙන් සලකමින් හා වෙන්කොට සැලකීමකින් තොර ව" යනුවෙන් එකතු කිරීමක් කරයි. තවද වත්මන් ව්‍යස්ථාවේ 10 සහ 14(1) (ඉ) ව්‍යවස්ථාවන්ට කේන්ද්‍රගත වෙමින් අනිකුත් ආගම්වල අයිතිවාසිකම් සුරක්ෂිත කරද්දී ඒ වෙනුවට නව සූත්‍රණය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සියලු ම පුද්ගලයන්ට සහතික කරමින් යනුවෙන් දක්වයි. මෙම භාෂාත්මක වෙනස තුළින් සහෝදර ආගම් කෙරෙහි වැඩි සුරක්ෂිතතාවයක් සහ අභිමානයක් ඇති කිරීමට දරා ඇති උත්සාහය අප අගය කළ යුතු ය. එ බැවින් හැකිනම් මෙම යෝජනාව ආදර්ශයට ගන්නා මෙන් ඉල්ලා සිටිමු.

2. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාදාමයේ දී එක්සත් පෙරමුණේ පාර්ශ්වකාර පක්ෂයක් වූ ප්‍රජාතාන්ත්‍රික කම්කරු සංගමය වෙනුවෙන් එහි නායකයා වූ ඒ. අසීස් මහතා ඉදිරිපත් කර තිබෙන යෝජනාව.

> ශ්‍රී ලංකා ජනරජයේ බහුතරයේ ආගම වන බුදුදහමට හිමිතැන ලබාදිය යුතු ය. එහෙයින් හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි සහ අන් සියලු ආගම්වලට ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති මූලික අයිතිවාසිකම් තහවුරු කරමින් බුදුදහම සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුතු ය.

In the Republic of Sri Lanka, Budhhism, the religion of the majority of the people, Shall be given its rightfull place and accordingly, it shall be the duty of the State to protect and foster Budhhism, while assuring to Hinduism, Islam, Christianity and all religions rights granted by basic resolution 5(4)

මෙහි මෙන් ම එවක තවත් යෝජනාවලද භාවිත වූ නිසිතැන යනු යෙදුම නොපැහැදිලි වූ බැවින් පසු ව එය ප්‍රමුඛස්ථානය ලෙස නිශ්චය කරගන්නා ලදී. එය සහ 72 ට අනුරූප ව දක්වා ඇති මූලික අයිතිවාසිකම් ගැන සදහන හැරුණු විට මෙය වත්මන් ව්‍යවස්ථාවෙන් ප්‍රධාන වසයෙන් ම වෙනස වන්නේ අයිතිවාසිකම් සුරක්ෂිත විය යුතු අනෙකුත් සියලු ම ආගම් ප්‍රකාශිත ව අන්ගතර්ගත කිරීම නිසා ය. මේ තුළ ඔවුන්ගේ අයිතිවාසිකම්ද සුරක්ෂිත කිරීමට ව්‍යවස්ථාව පොරොන්දු වීම සහ තමන්ද ව්‍යවස්ථාව තුළ නියෝජනය වීමත් හේතුවෙන් හින්දු, මුස්ලිම් සහ ක්‍රිස්තියානි ආගම් අදහන ජනතාවට එක්තරා ආකාරයක අභිමානවත්/ සුරක්ෂිත හැගීමක් ඇතිකිරීමට ඉඩ ඇති බව අසීස් මහතා මෙම යෝජනාවට හේතු දක්වමින් පවසා ඇත. ඒ අනුව මෙහි රතුපැහැයෙන් සලකුණු කර ඇති කොටස වත්මන් ව්‍යවස්ථාවේ 9 වන වගන්තියේ අදාල වචන වෙනුවට ආදේශ කිරීම පිළිබද ව සලකා බලන මෙන් ඉල්ලා සිටිමු.

3. පසුගිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාදාමය යටතේ පත් කළ ආගම පිළිබද අතුරු කමිටුවේ තුන්වන විකල්පය.

ශ්‍රී ලංකා ජනරජය සියලු ම ආගම්වලට සම තත්ත්වයක් දිය යුතුය. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වැනි හා 14(1) ඉ ව්‍යවස්ථාවලින් සියලු ආගම්වලට ලබා දී ඇති අයිතීන් ආරක්ෂා කරමින් රාජ්‍යය බුද්ධාගම හා බුද්ධ ශාසනය පෝෂණය කර ආරක්ෂා කළ යුතු ය.

( උපුල් අබේරත්න; එම්.එල්.ඒ. කාදර්; ලාල් විජේනායක; සිරිමසිරි හපුආරච්චි; සුනිල් ජයරත්න)

## ආ) මූලික අයිතිවාසිකම්

- පසුගිය රජය විසින් පත්කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුව වෙනුවෙන් මහාචාර්ය කපිල පෙරේරා සහ මහාචාර්ය කාමිනා ගුණරත්න විසින් සැකසූ වාර්තාව/ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ තිබූ පුලුල් සහ නවීන මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය අනුගමනය කිරීමට යෝජනා කර සිටිමු.

නැතිනම්

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සදහන් වන මූලික අයිතිවාසිකම්වලට පටහැනි ප්‍රතිපාදන, පවතින්නා වූ වෙනත් නීති/පනත්වල වෙතොත් එසේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල වන ප්‍රමාණයට එම ප්‍රතිපාදන අවලංගු වන සේ සැලකිය යුතු වන පරිදි වත්මන් ව්‍යවස්ථාවේ 16 (1) වගන්තිය වෙනස් කරන මෙන් ඉල්ලා සිටිමු.

- "ජීවත්වීමේ අයිතිය" සහ "ලිංගික දිශානතිකයක් හෝ අනන්‍යතාවක් තෝරාගැනීමට හා ඒ අනුව ගරුත්වයෙන් යුතු ව ජීවත්වීමට ඇති අයිතිය" යන මූලික අයිතීන් දෙක කිසිසේත් සීමා කළ නොහැකි මූලික අයිතිවාසිකම් දෙකක් ලෙස එක්කරන මෙන් ඉල්ලා සිටිමු.

- "පෞද්ගලිකත්වයේ අයිතිය" ජාතික ආරක්ෂාව සම්බන්ධ අවස්ථාවන්හි දී සීමා කළ හැකි මූලික අයිතිවාසිකමක් ලෙස එකක්රන මෙන් ඉල්ලා සිටිමු.

එ මෙන් ම (එනම් ඉහත අප යෝජනා තෝරාගත්ත ද, සදහන් කළ කෙටුම්පතේ මූලික අයිතවාසිකම් පරිච්ඡේදය යොදාගත්ත ද) මෙම යෝජනා ද ක්‍රියාත්මක කිරීම පිළිබද ව සලකා බලන මෙන් ඉල්ලා සිටිමු.

- විධායක හෝ පරිපාලන ක්‍රියාවකින් පමණක් නොව අධිකරණ ක්‍රියාවකින් ද මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවන විට එයට එරෙහි ව ද ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි ප්‍රතිපාදන එක්කිරීම පිළිබද ව සලකා බලන ලෙස ඉල්ලා සිටිමු.

- විධායක හෝ පරිපාලන ක්‍රියාවකින් පමණක් නොව රජයේ හෝ රජයේ නොවන කවර හෝ සංවිධානයක්, අධිකාරියක්, සංස්ථාවක්, පුද්ගලයකු විසින් මූලික අයිතිවාසිකමක් කඩවන විට මූලික අයිතීන් අහිමි වීම වැළැක්වීම පිණිස නිසි ක්‍රියාමාර්ග නො සැලැස්වීමේ හේතුව මත අදාල රාජ්‍ය ආයතන වගකිව යුතු කළ හැකි වන පරිදි නීති සම්පාදනය කරන මෙන් ඉල්ලා සිටිමු. නමුත් කිසියම් ආගමික නිකායක  සාමාජිකයන්ට අදාල වන නීති හා ආගමික සංස්ථාවන්හි අභ්‍යයන්තර රීති සම්බන්ධ නිදහස ආරක්ෂා වන පරිදි අතුරු විධානයක් ද සැලසිය යුතු ය. (භික්ෂුනී ශාසනය, දියවඩන නිලමේ පත්කිරීම වැනි කාරණා කෙරෙහි ස්ත්‍රී-පුරුෂ සමානාත්මතා පිළිබද නූතන සංකල්පවලින් බලපෑම් වීම වැළැක්වීම සදහා) නමුත් එම අතුරු විධානය ආගමික නීති ක්‍රියාත්මක කිරීමකට (Unequal citizens පොතේ ඉංග්‍රීසි පිටපතේ 27-28 පිටු බලන්න.) විරුද්ධව කටයුතු කිරීම වළක්වන තරම් ද නො විය යුතු ය.

- "කාන්තාවන්ගේ, ළමයින්ගේ, අබල තැනැත්තන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනුනීතිවලින් හෝ විධායක ක්‍රියා මාර්ගයෙන් හෝ විශේෂ විධිවිධාන සැලැස්වීමට" වත්මන් ව්‍යවස්ථාවේ 12 (2) මූලික අයිතිවාසිකම බාධාවක් නොවන බව පවසන වත්මන් ව්‍යවස්ථාවේ 12 (4) වගන්තිය පහත පරිදි සංශෝධනය කරන මෙන් ඉල්ලා සිටිමු.

  > ස්ත්‍රී-පුරුෂභාවය හෝ ලිංගික දිශානතිය හෝ අනන්‍යතාවය හෝ නිසා පීඩාවට පත්වන පුද්ගලයන්ගේත් කායික/මානසික විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන්ගේත් ප්‍රගතිය හෝ ආරක්ෂාව සඳහා නීතියෙන් හෝ අනුනීතිවලින් හෝ විධායක ක්‍රියා මාර්ගයෙන් හෝ විශේෂ විධිවිධාන සැලැස්වීම මේ ව්‍යවස්ථාවෙන් කිසිසේත් ම අවහිර නොවන්නේ ය.

- ජාතික ආරක්ෂාව සඳහා හැර සංස්කෘතිය භුක්ති විඳීමේ හා ආගම පිළිපැදීමේ ඉගැන්වීමේ අයිතිය සීමා කළ නොහැකි වන පරිදි, එනම් විවිධ මහජාතිකවාදී රැළි සන්තර්පණය කිරීම සඳහා සංස්කෘතික පළිගැනීම් සිදු කළ නො හැකි වන පරිදි විශේෂ විධිවිධාන යොදන මෙන් ද ඉල්ලා සිටිමු.

- එ මෙන් ම ICCPR වැනි පණත් අවභාවිතය වැළැක්වීමට ද, (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ප්‍රතිපාදන මගින් එවැන්නක් කළ හැකි නම්) ප්‍රතිපාදන සලසන මෙන් ඉල්ලා සිටිමු.

**ඇ) භාෂාව**

- වත්මන් ව්‍යවස්ථාවේ 24 (1) වගන්තිය අවසානයට පහත කොටස එක් කළ යුතු ය.

  එලෙස අධිකරණ ඇමතිවරයා විසින් අධිකරණයක නඩු වාර්තා තබාගැනීම අධිකරණයේ භාෂාව නොවන භාෂාවකින් විය යුතු යැයි විධාන කර ඇති විටක පවා, එම අධිකරණයේ භාෂාව නොවන භාෂාවෙන් තබාගන්නා නඩු වාර්තා නියමිත කාලයක් ඇතුළත සිංහල හා දෙමල භාෂාවලට පරිවර්තනය කර පළ කළ යුතු ය. එසේ ම මෙතෙක් එලෙස වෙනත් භාෂාවකින් පවත්වා ගත් නඩු වාර්තා ද නියම කරන කිසියම් කාලයක් ඇතුළත සිංහල හා දෙමල භාෂාවලට පරිවර්තනය කර පළ කළ යුතු ය.

- සිංහල භාෂාව පමණක් රාජ්‍ය භාෂාව ලෙස නම් කළ යුතු අතර දෙමල භාෂාව රාජ්‍ය භාෂාවක් ලෙස නම් නො කළ යුතු ය.

- නමුත් දෙමල භාෂාව ද සිංහල භාෂාව මෙන් ම මෙරට ජාතික භාෂාවක් ලෙසින් නම් කළ යුතු අතර වත්මන් ව්‍යවස්ථාවට 16 වැනි ව්‍යවස්ථාවෙන් භාෂා භාවිතය සම්බන්ධයෙන් පනවා ඇති විධිවිධාන එලෙසින් ම පවත්වා ගත යුතු ය.

නැතිනම් වත්මන් ව්‍යවස්ථාවේ 18 වන වගන්තිය පහත පරිදි වෙනස් විය යුතු ය.

- සිංහල හා දෙමල භාෂා ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා වන්නේ ය.

හේතුව :

වත්මන් ව්‍යවස්ථාවේ "රාජ්‍ය භාෂාව සිංහල වන්නේ ය" යනුවෙන් එක් වගන්තියක සඳහන් කර පසුව ඊළග වගන්තියේ "දෙමල භාෂාව ද රාජ්‍ය භාෂාවක් වන්නේ ය" යනුවෙන් සඳහන් කර තිබේ. මේ තුළින් සිංහල හා දෙමල යන දෙ පිරිස ම රැවටීමට ලක් කෙරේ. "සිංහල හා දෙමල රාජ්‍ය භාෂා වන්නේ ය" යනුවෙන් එක හෙළා නො පවසන බැවින් දෙමල ජනතාව රවටනු ලැබේ. රාජ්‍ය භාෂාව ලෙස නම් කර ඇත්තේ සිංහල භාෂාව පමණක් නො වන හෙයින් සිංහල ජනතාව රැවටීමට ලක් වේ. අපේ නම් අදහස වන්නේ රාජ්‍ය භාෂාව ලෙස නම්විය යුත්තේ සිංහල භාෂාව පමණක් බවත් සිංහල භාෂාවට මෙරට හිමි තත්ත්වය දෙමල භාෂාව සමග බෙදා නො ගත යුතු බවත් ය. ඒ අනුව සිංහල භාෂාව පමණක් රාජ්‍ය භාෂාව ලෙස නම් කළ යුතු අතර දෙමල භාෂාව රාජ්‍ය භාෂාවක් ලෙස නම් නො කළ යුතු ය. නමුත් දෙමල භාෂාව ද සිංහල භාෂාව මෙන් ම මෙරට ජාතික භාෂාවක් ලෙසින් නම් කළ යුතු අතර එය උතුරු නැගෙනහිර පලාත්වල අධිකරණ හා පරිපාලන කටයුතුවල දී භාවිතා කිරීමට නිසි ප්‍රතිපාදන සැලසිය යුතු ය.

## ඈ) රාජ්‍යය මෙහෙයවීමේ මූලධර්ම සහ රාජ්‍ය ප්‍රතිපත්ති

- වත්මන් ව්‍යවස්ථාවේ මෙම පරිච්ඡේදයේ 27 (1) වගන්තියේ "ගුරු කොට ගනු ලබන්නේ ය." යන වචන වෙනුවට "ගුරු කොට ගනු ලැබිය යුතු ය." යන වචන ආදේශ විය යුතු ය.

- වත්මන් ව්‍යවස්ථාවේ මෙම පරිච්ඡේදයේ 29 වන වගන්තිය ඉවත් කරන ලෙස (ඊට සමාන ප්‍රතිපාදන නව ව්‍යවස්ථාවට එක් නො කරන ලෙස) ඉල්ලා සිටිමු.

## ඉ) විධායකය (ජනාධිපති, කැබිනට් මණ්ඩලය, මහජන සේවකයන්)

**ජනාධිපතිවරයා**

ජනපති ධූරයේ බලතල සම්බන්ධයෙන් පහත වෙනස්කම් කරන ලෙසත් මෙම සීමාකිරීම් වත්මන් ජනපතිවරයාට රට නංවාලීම සඳහා බාධාවක් විය හැකි බව පෙනීයන්නේ නම් මෙම ප්‍රතිපාදන ඔහුගේ ධූර කාලයන්ට පමණක් අදාල නො වන ලෙස අන්තර්කාලීන විධිවිධානයක් සහිත ව හෝ මෙම ප්‍රතිපාදන ඇතුළත් කිරීම පිළිබඳ ව සලකා බලන ලෙසත් ඉල්ලා සිටිමු.

- වත්මන් ව්‍යවස්ථාවේ ඇති දෝෂාභියෝග ක්‍රියාදාමය අපේක්ෂිත අරමුණ කරා යාම අති දුෂ්කර කරවන්නක් බැවින් ජනාධිපතිවරයා විසින් සිතා මතා ම ආණ්ඩුක්‍රමව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති විටක හෝ අල්ලස/දූෂණය සම්බන්ධ වරදක් කර ඇති විටක හෝ තනතුරේ කටයුතු පවත්වාගත නොහැකි ශාරීරික හෝ මානසික නුසුදුසුබවකින් පෙළෙන විට ඕනෑම පුරවැසියකු විසින් යොමු කරන ශ්‍රේෂ්ඨාධිකරණ පෙත්සමකින්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අදාල චෝදනාවට සත්‍ය බව තහවුරු කරනු ලැබීම විසින් ම (එනම් පාර්ලිමේන්තු ක්‍රියාදාමයකින් තොර ව) එම ධූරය දැරීම අහෝසි වන පරිදි කටයුතු සම්පාදනය කිරීමට යෝජනා කර සිටිමු. නැතිනම් වත්මන් දෝෂාභියෝග පටිපාටිය පහත පරිදි සරළ කරන මෙන් ඉල්ලමු.

    1. ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇතැ යි හෝ මානසික/ශාරීරික ව නුසුදුසු යැයි හෝ අල්ලස/දූෂණය සම්බන්ධ වරදක් කර ඇතැ යි හෝ යෝජනාවක් පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත විය යුතු ය.
    2. එවැනි යෝජනාවක් සම්මත වූ විටක කථානායකවරයා එය අගවිනිසුරුවරයාට යොමු කිරීම අනිවාර්ය විය යුතු ය. (ඔහු එසේ කිරීමට බැඳී සිටී)
    3. එවිට ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් විසින් ජනපතිවරයාට එරෙහි චෝදනාව සත්‍ය යැයි තීන්දු වුවහොත් (නැවත පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීමකින් තොර ව) ජනපතිවරයාගේ ධූරය අහිමි විය යුතු ය.

- එමෙන් ම එසේ ජනාධිපතිවරයකු දෝෂාභියෝගයකින් ඉවත් කෙරුණු විට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක කැමැත්ත ඇත්තේ නව ජනාධිපතිවරණයක් පැවැත්වීමට නම් (අනුප්‍රාප්තික ජනාධිපතිවරයකු පත් නොකර) එසේ කළ හැකි විය යුතු ය.

- රාජකාරී මට්ටමින් කරන ලද කාර්යයන්හි දී හැර ජනාධිපතිවරයා විසින් පෞද්ගලික මට්ටමින් කරන ලද ඕනෑම සිවිල් හෝ අපරාධ වරදක් සම්බන්ධ ව ධූරය දරන කාලය තුළ ම නඩු පැවරිය හැකි ලෙස විනිර්මුක්තිය ලිහිල් කරන මෙන් ඉල්ලා සිටිමු. කිසියම් පුද්ගලයකුට දඬුවම් නියම කරන විටක ඔහු/ඇය ජනාධිපති ධූරයේ කටයුතු කළ කාලය අතහැරිය යුතු බව පවසන වගන්තිය ද සුදුසු පරිදි සංශෝධනය කරන මෙන් ඉල්ලා සිටිමු.

- එමෙන් ම ජනාධිපතිවරයා වෙනුවට නීතිපතිවරයා වගඋත්තරකරුවකු කරගනිමින් ඔහුගේ ක්‍රියාවන්ට එරෙහි ව මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කිරීමේ හැකියාව ද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කරන මෙන් ඉල්ලා සිටිමු.

- ආරක්ෂක අමාත්‍යධූරයට අමතර ව ජනාධිපතිවරයාට පවරා ගත හැකි අමාත්‍යංශ/දෙපාර්තමේන්තු/සංස්ථා/ආයතන ගණන සංඛ්‍යාත්මක ව සීමා කරන මෙන් ඉල්ලා සිටිමු. එ මෙන් ම හදිසි අවස්ථාවක දී එම සංඛ්‍යා නො සලකා පවරා ගත හැකි බවටත් එහෙත් එසේ පවරා ගෙන තබා ගත හැකි කාලසීමාවක් ද පනවන ලෙසත් ඉල්ලා සිටිමු.

- ජනාධිපතිවරයාට උපකුලපතිවරුන් පත්කිරීමට නොහැකි විය යුතු ය. ඔවුන් ඔහුගේ අත්සන යටතේ පත්වීම කම් නැතත් උපකුලපතිවරුන් විය යුත්ත් කවුරුන් දැයි තීරණය කිරීමේ හැකියාවක් ජනපතිට නොතිබිය යුතු ය.

- ජනාධිපතිවරයාට ඕනෑම අවස්ථා 2 ක දී පමණක් ස්වාභාවික ව විසිරීමට පෙර පාර්ලිමේන්තුව විසුරවීමට හැකියාව තිබෙන පරිදි කටයුතු සලසන මෙන් ඉල්ලා සිටිමු.

- ජනාධිපතිරයාට පොලිස්පතිවරයා පත් කළ හැකි වුවත් ඉවත් කළ නොහැකි විය යුතු අතර අදක්ෂතාවය හෝ අල්ලස/දූෂණය යන කරුණු දෙක ම හෝ එකක් මත විභාග කර ඔහු වරදකරු ද නිවැරදිකරු ද යන්න තීරණය කිරීම පොලිස් කොමිෂන් සභාව කළ යුතු අතර වැරදිකරුවකු බව තීරණය වූ විට පමණක් ජනාධිපතිවරයාට පොලිස්පතිවරයා ඉවත් කළ හැකි විය යුතු ය. පොලිස්පතිවරයා ඕනෑම විටක කැමති පරිදි ඉවත් කිරීමේ හැකියාව ජනපතිවරයාට ලබා දෙන්නේ නම්, ඔහු සිය රාජකාරී නිසි පරිදි කිරීමකට (අනාගත ජනපතිවරයකුගේ සමීපතමයකු කළ වරදකට අත්අඩංගුවට ගැනීමක් වැන්නකට) පළිගැනීමක් ලෙස ඉවත් කරන ලෙස පෙනී යන අවස්ථාවක දී ඔහුට එම ඉවත් කිරීමට එරෙහි ව උපරිමාධිකරණයකට හෝ සාධාරණ විභාගයක් පැවැත්විය හැකි වෙන යම් මණ්ඩලයකට අභියාචනා කර එම ඉවත්කිරීම බලරහිත කරවා ගැනීමට හැකියාව තිබිය යුතු ය.

- එහෙත් 19 වන සංශෝධනයට පෙර 1978 ව්‍යවස්ථාවෙන් ජනාධිපතිරයාට පැවති සෙසු බලතල එලෙස ම පැවතිය යුතු ය.

- එසේ ම පහත දැක්වෙන, මහජන සේවකයන් පිළිබඳ පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි ඉදිරියේ දී පත්විය හැකි අන්තනෝමතික විධායක ජනාධිපතිවරයකු විසින් රාජ්‍ය නිලධාරීන් පත්කිරීම, ඉවත්කිරීම දේශපාලනික කාරණා මත කිරීම වළක්වමින් ඔවුන් ව ස්වාධීන කිරීමට ප්‍රතිපාදන සලසන මෙන් ද ඉල්ලා සිටිමු.

**අමාත්‍යවරුන් පත්කිරීම**

- කටයුතු කිරීමේ පහසුව සඳහා කිසියම් එක් අමාත්‍යවරයකුගේ විෂය පථය යටතේ ම තිබිය යුතු එකකට එකක් සම්බන්ධ විය හැකි දෙපාර්තමේන්තු/ ආයතන/ සංස්ථා/ මණ්ඩල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව විසින් උපලේඛනගත ව තිබිය යුතු බව ද ඒ ඒ විෂය පථය යම් අමාත්‍යවරයකුට පැවරෙන විට එම එකට පැවතිය යුතු ලෙස නම් කළ ව්‍යුහ

සියල්ල ම එම අමාත්‍යවරයා යටතට ම පැවරෙන ලෙසත් ප්‍රතිපාදන සලසන මෙන් ඉල්ලා සිටිමු.

- අමාත්‍ය මණ්ඩලය 30 කට සීමා කර කැබිනට් නො වන අමාත්‍යවරු පත්කිරීමට ඇති හැකියාව ද අහිමි කරන්නේ නම් මැනවි. (හේතුව - අමාත්‍ය මණ්ඩලය අඩු කළා යැයි කියමින් කැබිනට් නො වන/රාජ්‍ය අමාත්‍යවරුන් බුරුතු ගණනින් පත්කරමින් අපගේ බුද්ධියට නිගා කරන බැවිනි.)

**මහජන සේවකයන්**

19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කළ සියලු ම කොමිෂන් සභා පවත්වා ගන්නා ලෙසත් එම සාමාජිකයන් ඉවත්කිරීම සම්බන්ධව පහත ප්‍රතිපාදන සලකා බලන ලෙසත් ඉල්ලා සිටිමු.

- රෝගීබව හෝ මානසික දුර්වලතාවය, දූෂිත චරිතය, ස්වාධීන නොවීම යන කාරණා මත හැර කොමිෂන් සභාවල සාමාජිකයන් ඉවත් කිරීමට ජනාධිපතිවරයාට නොහැකි විය යුතු ය.

- මෙම හේතුවක් මත හෝ ඉවත් කරන අවස්ථාවක දී එම චෝදනාව අසත්‍ය චෝදනාවක් නම් අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කර එම අධිකරණයක් දෙන තීන්දුව මගින් ජනපතිවරයාගේ එම ඉවත්කිරීමේ තීරණය බලරහිත කරවා ගැනීමට ඔවුන්ට හිමිකම් ඇති බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කළ යුතු ය. මෙම විභාගයක දී එම අධිකරණය අදාල කොමිෂන් සභා සාමාජිකයාට එරෙහි ව ඇති චෝදනාව සත්‍යය ද යන්න විමසා බැලිය යුතු ය.

- කොමිෂන් සභා සාමාජිකයන් බාහිර බලපෑම් වලින් ආරක්ෂා කිරීමේ අරමුණින් දැක්වූ ඉහත ප්‍රතිපාදනවලට අමතරව ඔවුන් තමන් විසින් ම සිය ස්වාධීන නොවී (සිය දේශපාලනික, පෞද්ගලික, ආගමික, වාර්ගික) අරමුණු වෙනුවෙන් කටයුතු කරන බව පෙනී යන්නේ නම් ධූර අහෝසි වීමට කටයුතු සැලසිය යුතු ය. මේ අරමුණ සඳහා කොමිෂන් සභා සාමාජිකයන් ඔවුන්ගේ වගකීම් සමග බැඳෙන දේශපාලනික කටයුතු (විවිධ ව්‍යාපාර/සංවිධාන/පක්ෂවල සාමාජිකයන් වීම), අධිකරණ ක්‍රියාමාර්ග, ව්‍යාපෘති ආදියේ කොටස්කරුවන් වීම/නියුතු වීම, ඔවුන්ගේ ස්වාධීන ප්‍රතිරූපය සම්බන්ධයෙන් හානි විය හැකි හෝ මහජනයා තුළ සැක ඇති විය හැකි වෙනත් ක්‍රියාකාරකම් කිරීම හා මත පළකිරීම ආදියෙන් වැළැක්වීමට ද ප්‍රතිපාදන සැලසිය යුතු ය.

- ඉහත ඔවුන් ඉවත් කළ හැකි හේතූන් හි දූෂිත චරිතය යන්නට අල්ලස, මූල්‍ය වංචා, ජාතික/ආගමික සමගියට, මහජන සාමයට අහිතකර හැසිරීම්/ප්‍රකාශ ආදිය ද ඇතුළත් විය යුතු ය.

- ඉහත අවසානයට සඳහන් කළ අරමුණු දෙක වෙනුවෙන් විනය සංග්‍රහයක් සකස් කර පැනවිය යුතු ය. කිසියම් අයකු එම විනය සංග්‍රහයට පටහැනි ව කටයුතු කර ඇතැ යි උපරිමාධිකරණයකට හෝ මෙවැනි කාරණා විභාග කිරීමට තැනූ වෙන යම් ස්වාධීන මණ්ඩලයකට පැමිණිළි කිරීමට මහජනයාට හැකි විය යුතු ය. ඔවුන් විසින් එය

සාධාරණ ව විභාග කර බලා අදාල සාමාජිකයා ව නෙරපන ලෙස ජනාධිපතිවරයාට දැන්විය යුතු ය. එවිට ජනාධිපතිවරයා ඒ අනුව කටයුතු කළ යුතු ය.

17 වැනි සංශෝධනයට අදාල ව එ මගින් ඇති කළ ස්වාධීන කොමිෂන් සභා අර්ථවත් කිරීමට මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා කළ යෝජනාවලියක් මෙතන ඇත. එය ද අවධානයට ගන්නා මෙන් ඉල්ලා සිටිමු.

### ඊ) ව්‍යවස්ථාදායකය

#### මන්ත්‍රීන් නැවත කැඳවීම

නැවත පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීමට පෙර, දැනට පත් ව සිටින මන්ත්‍රීවරයකු සම්බන්ධයෙන් පෙත්සමක් ඉදිරිපත් කොට අධිකරණ විභාගයකින් පසු මන්ත්‍රී ධූරය අහෝසි කර එම පුරප්පාඩුවට අතුරු මැතිවරණයක් කැඳවිය හැකි වන පරිදි ඇතැම් රටවල ප්‍රතිපාදන සලසා තිබේ. ඒ අනුව යමින් මෙරට ද ජනතාවට ඇවැසි විටක මන්ත්‍රීවරුන් නැවත කැඳවිය හැකි ප්‍රතිපාදන නව ව්‍යවස්ථාවට ඇතුළත් කරන මෙන් ඉල්ලා සිටිමු. (බලන්න. Recall election)

#### මන්ත්‍රීන් වීමට නුසුදුසුකම්

එමෙන් ම පහත කරුණු සපුරන පුද්ගලයන් කිසිම ව්‍යුහයක මන්ත්‍රීවරයකු වීමට නුසුදුස්සන් වන පරිදි (මෙම කරුණු සැපිරීමට අවශ්‍ය අනෙකුත් ව්‍යුහ හා ප්‍රතිපාදන ද සහිත ව) විධිවිධාන ඇතුළත් කළ යුතු බවට ද ඉල්ලා සිටිමු.

- වත්කම් ප්‍රකාශ භාර නො දීම හෝ පෙර වත්කම් ප්‍රකාශ සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂණයක් තුළින් අයතා ඉපයීම් පිළිබඳ සැක මතුකර තිබීම.

- මහජන ජීවිතය ආවරණය වන පරිදි සකස් කර පණවනු ලැබූ ආචාර ධර්ම - හැසිරීම් - සංග්‍රහයකට පටහැනි ව කටයුතු කළ බවට අධිකරණයක් විසින් තීරණය කරනු ලැබීම. (මෙවැනි සංග්‍රහයක් පැණවිය යුතු අතර එයට උත්තරීතර සභාවක උත්තරීතර සාමාජිකයකුගේ චරිතයට/ප්‍රතිරූපයට නුසුදුසු ක්‍රියා ඇතුළත් විය යුතු ය. නිදසුන්: පාර්ලිමේන්තුව හෝ ඉන් පිටත කරන ප්‍රචණ්ඩ හැසිරීම්) මේ යටතේ නුසුදුස්සන් කිරීම අවශ්‍ය නම් කිසියම් කාලයකට පමණක් කිරීමට හැකි වන පරිදි විධිවිධාන සැලසිය යුතු ය.

- සාමාන්‍ය බුද්ධි පරීක්ෂණයකින් බුද්ධි ඵලය 100 ට අඩු වීම හෝ දේශපාලන-ආර්ථික-නීති කරුණු පිළිබඳ සාමාන්‍යාවබෝධය ප්‍රශ්න පත්‍රයකින් සැලකිය යුතු ලකුණු සංඛ්‍යාවක් නො ලැබීම.

#### පාර්ලිමේන්තුවේ දී ඡන්දය දුන් හෝ එහි කටයුතුවලට සහභාගී වූ අයකු එහි සාමාජිකයකු නො වන බව පසුව අනාවරණය වුවහොත්

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නොවන තැනැත්තකු පාර්ලිමේන්තුවේ කටයුතුවලට සහභාගී වී ඇති බව සතියක් ඇතුළත අනාවරණය වුවහොත් එම පාර්ලිමේන්තු ක්‍රියාදාය බලරහිත වන බවටත් නැවත පැවැත්විය යුතු බවටත් වත්මන් ව්‍යවස්ථාවේ 69 වගන්තිය සංශෝධනය විය යුතු ය. සතියක් ඇතුළත අනාවරණය නොවී පසුව අනාවරණය වන විටක දී එම තීරණ වලංගු සේ සැලකිය යුතු ය.

## උ) ඡන්දබලය මැතිවරණ සහ ජනමත විචාරණය

**ජනමත විචාරණය**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කර ඇති වගන්තිවලට අමතරව ජනපතිට සුදුසු යැයි හැඟෙන වෙනත් පනත් ද ජනමත විචාරණයකට ඉදිරිපත් කර සම්මත කර බලාත්මක කිරීමේ හැකියාව තිබිය යුතු ය.

- අමතර වශයෙන් ස්විට්සර්ලන්තයේ ඇතැම් කැන්ටනවල මෙන් මහජනතාව සැලකිය යුතු පිරිසකගේ (අවම අත්සන් සංඛ්‍යාවක් නියම කළ යුතු ය.) අත්සනින් යුතු යෝජනාවක් ජනමත විචාරණයකින් සම්මත කර එනයින් ම නීතියක් බවට පත්කරගැනීමට ද විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සලසන මෙන් ඉල්ලා සිටිමු. මෙවැනි යෝජනාවක් ජනමත විචාරණයකින් සම්මත වීමට පෙර හෝ පසු හෝ කිසිදු විටක පාර්ලිමේන්තුවේ හෝ ජනපතිගේ හෝ අනුමැතිය ලැබීම අවශ්‍ය නොවිය යුතු ය. එහෙත් එවැනි යෝජනාවක් ජනමත විචාරණයකට යැවීමට පෙර පහත කරුණුවලට අනුකූල දැයි තීරණය කර ජනමත විචාරණයක් සඳහා යොමුකළ යුතු බව තීරණය කිරීමට කෘතහස්ත පරිපාලන නිළධාරීන්/විද්වතුන්/හිටපු විනිසුරන් වැනි අයවලුන් හෝ සුදුසු වෙනත් අයවලුන් වන 5 දෙනෙකුගෙන් සමන්විත ස්වාධීන විද්වත් මණ්ඩලයක් ජනපතිවරයා විසින් පත් කළ යුතු අතර එම සාමාජිකයන්ගෙන් තිදෙනෙකු සුලුජාතීන් හා ආගම් නියෝජනය වන පරිදි පත් කෙරිය යුතු ය. මෙම සාමාජිකයන් ඉවත්කිරීම සම්බන්ධයෙන් 18 වැනි සංශෝධනයට පෙර විගණාධිපති, ඔම්බුඩ්ස්මන් වැනි ධූරවල සිටින්නන් ඉවත් කිරීම සම්බන්ධයෙන් පැවති ප්‍රතිපාදන තිබිය යුතු ය.

  ඉහත සඳහන් කළ පරිදි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කර ඇති පුරවැසි අත්සන් සංඛ්‍යාවෙන් සමන්විත යෝජනාවක් මෙම මණ්ඩලයට ඉදිරිපත් වුණු විට ඔවුන් විසින් එම යෝජනාව:

  - වාර්ගික, ආගමික සහජීවනයට, ජාතික ආරක්ෂාවට, රටේ කාර්යක්ෂම පාලනයට හා ප්‍රගතියට අහිතකර වීම

  - ප්‍රායෝගික නොවීම හෝ මහජනතාවට හා රටට සැලකිය යුතු වාසියක් නොවීම

යන කාරණා සපුරන්නේ ද යන්න සලකා බැලිය යුතු ය. එය තීරණය කිරීමේ දී අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන්, පරිපාලන නිලධාරීන්, ක්ෂේත්‍රවල වියතුන් සහ අවශ්‍ය යැයි සිතෙන සෙසු පුද්ගලයන්ගෙන් කරුණු විමසා බැලිය හැකි ය. ඉහත සඳහන් ගැටලුසහගත කරුණු සම්මුඛ නොවන්නේ නම් එය ජනමත විචාරණයකට ලක්කිරීම සඳහා ජනපතිවරයා වෙත යොමු කළ යුතු ය. එසේ යොමු කරනු ලැබූ විට එය ජනමත විචාරණයට ලක්කිරීම සඳහා ජනපතිවරයා බැඳී සිටිය යුතු ය.

**මැතිවරණ ක්‍රමය**

පසුගිය රජය විසින් පැවත් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අදහස් දැක්වූ පරිදි විය යුතු යැයි යෝජනා කර සිටිමු.

## ඌ) බලය බෙදාහැරීම

පළාත් සභා අහෝසි කළ යුතු බව අපගේ පෞද්ගලික අදහස වුවත් පළාත් සභා දිගට ම පවත්වා ගැනීමට අදහස් කරන්නේ නම් පහත වෙනස්කම් ඒ සම්බන්ධ ව කිරීම පිළිබද ව සලකා බලන මෙන් ඉල්ලා සිටිමු.

**පළාත් සභා ඉවත් නොකරන්නේ නම් පලාත් සභා සම්බන්ධයෙන් පහත වෙනස්කම් කරන මෙන් යෝජනා කර සිටිමු.**

- පළාත් පාසල් හා ජාතික පාසල් අතර ද, පළාත් ගුරු/විදුහල්පති හා ජාතික පාසල් ගුරුවරුන්/විදුහල්පතිවරුන් අතර ද ඇති විෂමතාවන් නැති කරන මෙන් ඉල්ලා සිටිමු. නිදසුන් ලෙස පළාත් පාසල් හා ජාතික පාසල් බෙදීම සහ ඒ පදනම් කරගත් ගුරු හා විදුහල්පති බෙදීම් අහෝසි වන පරිදි පාසල් විෂය මුළුමනින් ම මධ්‍යයම රජයට පවරා ගන්නා ලෙස (සංවෘත ලැයිස්තුවට එක්කරන ලෙස) ඉල්ලා සිටිමු. අවශ්‍ය නම් කණිෂ්ඨ හා ප්‍රාථමික විද්‍යාල පමණක් පළාත් සභා යටතේ තැබිය හැකි ය.

- පළාත්වලට පොලිස් බලතල දීම සම්බන්ධව දක්වා ඇති සියලු ප්‍රතිපාදන අහෝසි කර පොලිස් බලතල සංවෘත ලැයිස්තවට එක්කරන මෙන් (පොලිස් බලතල සම්බන්ධ 9 වන උපලේඛනයේ පළමු වගන්තිය සංශෝධනය විය යුතු අතර පළමුවන පරිශිෂ්ටය හා සෙසු ප්‍රතිපාදන අහෝසි විය යුතු ය.) ඉල්ලා සිටිමු.

- පළාත් සභා ලැයිස්තුවේ 28 වන වගන්තියේ "ආගමික සහ වෙනත්" යන වචන ඉවත් විය යුතු ය.

- පළාත් සභා ලැයිස්තුවේ 29. 1 වගන්තිය ඉවත් විය යුතු ය.

- පළාත් සභා ලැයිස්තුවේ 25. 1 වැකියෙන් "කෞතුකාගාර" යන වචනය ඉවත් විය යුතු ය.

- පෞරාණික සහ ඓතිහාසික ස්මාරක සහ වාර්තා සම්බන්ධ ව පළාත් සභාවලට ඇති බලතල ඉවත් විය යුතු ය. (පළාත් සභා ලැයිස්තුවේ 25.2 වැකිය)

- පළාත් සභා ලැයිස්තුවේ 32 වගන්තිය සංශෝධනය විය යුතු ය. පලාත් ලැයිස්තුවේ ප්‍රඥප්තිවලට එරෙහි වැරදි සම්බන්ධ බලය මධ්‍යම රජය යටතේ තබාගැනීම හෝ ඒ සම්බන්ධයෙන් මැදිහත්වීමක් කිරීමට ප්‍රබල හැකියාවක් තබා ගත යුතු ය.

මෙහි පළමු කරුණ හැර සෙසු යෝජනාවලට හේතුව එල්. ටී. ටී. ඊ. සැමරුම් මානසිකත්වයන් සහ ඉස්ලාමීය අන්තවාදී ආගමික කණ්ඩායම් හා ක්‍රියාකාරකම් ආශ්‍රිත ව පළාත් සභා බලතල සියුම් මනෝවිදයාත්මක අයුරකින් හෝ අවියක් කර ගැනීම වැළැක්වීම යි.

**නැතිනම් පලාත් සභා අහෝසි කළ යුතු බවත් දෙමල ජනතාවගේ ගැටලුවට විසඳුම් වශයෙන් පහත ක්‍රියාමාර්ගයක්/යන් අනුගමනය කරන ලෙස සහ ඊට අදාල ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සලසන ලෙසත් ඉල්ලා සිටිමු.**

- පසුගිය රජය විසින් පත්කළ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව සම්බන්ධයෙන් ජාතික හෙළ උරුමය වෙනුවෙන් පාඨලී චම්පික රණවක ලියා එවූ නිරීක්ෂණයේ මේ සම්බන්ධ ව සඳහන් යෝජනා. (එහි අවසානයට දක්වා ඇති විවිධ පක්ෂවල නිරීක්ෂණ ද බලන්න.)

- විමධ්‍යගත කළ යුත්තේ දේශපාලනික බලය නො ව පරිපාලන බලය බව පවසන ආචාර්ය සූරිය ගුණසේකර මහතාගේ අදහස.

- 13 වැනි සංශෝධනය අහෝසි කර දිස්ත්‍රික් සංවර්ධන කමිටු ඇති කළ යුතු බව පවසන හිටපු මහාචාර්ය නලින් ද සිල්වා මහතාගේ මතය ද සැලකිල්ලට ගන්නා මෙන් ඉල්ලා සිටිමු.

හේතුව:

> මෙරට පලාත් සභා පිහිටුවනු ලැබුවේ පරිපාලන අවශ්‍යතාවයක් ලෙසින් නො ව විදේශීය බලපෑමකට ප්‍රතිචාරයක් ලෙසිනි. දෙමල ජනතාවගේ ගැටලුවට ද එය විසඳුමක් වූ බවක් නො පෙනේ. දෙමල භාෂාව කථාකරන ජනතාව උතුරු නැගෙනහිර පලාත්වලට වඩා සෙසු ප්‍රදේශවල ජීවත් වන බැවිනි. මින් සිදුවන එක ම දෙය වන්නේ උතුරු නැගෙනහිර පලාත්වල වාර්ගික/ආගමික හැඟීම් ශක්තිමත් වීම ම පමණි. දෙමල ජනතාවගේ ගැටලුවට සැබෑ විසඳුමක් දීමට අවශ්‍ය නම් කළ යුත්තේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල දෙමල භාෂාව භාවිතයට අවශ්‍ය පහසුකම් වැඩි කරමින් එය නිසි පරිදි සිදුවන්නට ඉඩ සැලසීම යි. අනවශ්‍ය වූ - මන්ත්‍රී, අමාත්‍ය පිරිසක් නඩත්තු කිරීමට සිදුවන බැවින් ද විශාල වියදමක් අනවශ පරිදි දැරීමට සිදු වන බැවින් ද ලොකු සේවයක් සිදු නො වන බැවින් ද මෙය රටට අනවශ්‍ය බව අපේ හැඟීමයි. ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධයෙන් මෙන් ම දෙමල ජනතාවගේ ගැටලු සම්බන්ධයෙන් ද වැඩි සහනයක් සැලසිය හැක්කේ ප්‍රාදේශීය සභා වැනි ව්‍යුහ ශක්තිමත් කිරීමෙන් බව අපේ විශ්වාසය යි.

**ෆෙඩරල් කිරීම**

ශ්‍රී ලංකාව ෆෙඩරල් රාජ්‍යයක් නො විය යුතු බව අප අදහස වුවත් ෆෙඩරල් රාජ්‍යයක් කරන්නේ නම් උතුරු පළාත, උතුරුමැද පළාත, වයඹ පළාත ඇතුළත් එක් ඒකකයක් ද, නැගෙනහිර පළාත හා මධ්‍යයම පළාත ඇතුළත් එක් ඒකකයක් ද, සබරගමුව පළාත හා ඌව පළාත හා දකුණු පළාත හා බස්නාහිර පළාත ඇතුළත් එක් ඒකකයක් ද වශයෙන් ඒකක 3 ක් ලෙස පමණක් කළ යුතු ය. වත්මන් පළාත් බෙදීම් පදනම් කරගනිමින් ඒකක 9 ක් ලෙස හෝ දෙමල/මුස්ලිම් බහුතරයක් පදනම් කරගත් ඒකකයක් ලෙස හෝ දෙමල මුස්ලිම් බව පදනම් කරගත් ඒකක දෙකක් එකතු කර සැකසෙන ඒකකයක් හෝ ඇතුළත් නො විය යුතු ය.

## ඎ) අධිකරණය

### උපරිමාධිකරණ විනිසුරන් ඉවත් කිරීමේ පටිපාටිය

- අගවිනිසුරු, ශ්‍රේෂ්ඨාධිකරණ හෝ අභියාචනාධිකරණ විනිසුරන් ඉවත්කිරීමට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් හැකිවිය යුතු නමුත් එසේ ඉවත් කිරීමේ යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකි විය යුත්තේ පහත ආකාරයේ කමිටුවකින් දූෂිත ව කටයුතු කරන බවට තීන්දු කළ හොත් පමණි.

- එවන් මණ්ඩලයකට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීන් 5 ක් විපක්ෂයේ මන්ත්‍රීන් 5 ක් සහ ස්වාධීන විද්වතුන් 3 ක් ඇතුළත් විය යුතු අතර ජනාධිපතිවරයා විසින් දැනුම් දුන් පසු කථානායකවරයා විසින් අදාල පක්ෂවලින් මන්ත්‍රීන් නම් කරන ලෙස ඉල්ලා සිටිය යුතු ය. විපක්ෂයෙන් පත්වන මන්ත්‍රීන්ගෙන් 3 ක් විපක්ෂයේ ප්‍රධාන පක්ෂය හැර සෙසු පක්ෂවලින් සමන්විත විය යුතු ය.

- ස්වාධීන විද්වතුන් තිදෙනා පත්විය යුත්තේ අගමැති, විපක්ෂනායක, විපක්ෂයේ දෙවැනියට වැඩි ම පිරිසක් සිටින පක්ෂය විසින් එක් අයකු බැගින් යෝජනා කිරීමෙනි. එසේ යෝජනා කළ විට ජනපති විසින් ඔවුන් පත් කළ යුතු අතර එවැනි කරුණක් විභාග කිරීමට තරම් ප්‍රාමාණිකයන් වන, ප්‍රසිද්ධ දේශපාලන කටයුතුවල නියුතු නොවූ, දූෂිත චරිත නොමැති අය විය යුතු ය. මේ කාර්යයේ දී ඉහත සඳහන් කළ අය නියමිත කාලයක් ඇතුළත නමක් යෝජනා කිරීම අනිවාර්ය විය යුතු අතර එම කාලය තුළ එසේ යෝජනා නොකළ හොත් පමණක් ජනපතිවරයාට තමා අභිමත අයකු පත්කිරීමට හැකියාව තිබිය යුතු ය.

- මෙලෙස විනිසුරුවරයකු ඉවත් කිරීමේ කටයුත්තක් ඇරඹීමට අදහස් කරන අවස්ථාවේ දී එම චෝදනාවට ලක් වූ විනිසුරුවරයා යම් නඩුවක් විභාග කරමින් සිටියේ නම් මෙම ක්‍රියාදාමය ඇරඹිය හැකි විය යුත්තේ එම නඩුව විභාග වී අවසන් වීමෙන් පසුව ය.

### ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පාර්ලිමේන්තු පනත් බලරහිත බව ප්‍රකාශ කිරීම

- කිසියම් කෙටුම්පතක් බලරහිතබව ප්‍රකාශ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට හැකියාව ලබා දීම පිළිබඳව ද සලකා බලන මෙන් ඉල්ලා සිටිමු.

## සඎ) මහජන ආරක්ෂාව

**ආගමික රාජ්‍යය වෙනුවෙන් ක්‍රියාකිරීම සහ ආගමික නීති ක්‍රියාත්මක කිරීම වැළැක්වීම**

ඉස්ලාමීය ව්‍යාප්තිවාදයේ, මූලධර්මවාදයේ මෙරට නැගීමත් සමග උද්ගත විය හැකි අනතුරුදායක තත්ත්වයන් මැඩ පැවැත්වීම සඳහා සුදුසු වෙනස්කම් සහිත පහත ආකාරයේ ප්‍රතිපාදන ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කළ යුතු බවට යෝජනා කර සිටිමු.

1. ශ්‍රී ලංකාව තුළ හෝ පිටත ශ්‍රී ලංකාව හෝ වෙන යම් රාජ්‍යයක් ආගමික රාජ්‍යයක් බවට පත්කිරීමට සැලසුම් කිරීම, ජනමතය සකස් කිරීම, කටයුතු කිරීම සහ ඊට ආධාර කිරීම, කවර හෝ ආකාරයකින් අනුබල දීම කැරළිකාරිත්වයක් ලෙසින් සැලකිය යුතු අතර සුදුසු මට්ටමේ දඬුවම් පැමිණවිය යුතු ය.

මෙහි ආගමික රාජ්‍යයක් යනු පහත ලක්ෂණ සියල්ලම හෝ කීපයක් සපුරන පාලන ක්‍රමවේදයක්, අධිකරණ පද්ධතියක් හෝ එවැනි බල ඇති වෙන යම් ව්‍යුහයක් හෝ නීතියක් විය හැකි ය.

- මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය නොපැවතීම වැනි ආඥාදායකයක ලක්ෂණ තිබීම

- විශ්වීය ව පිළිගත් මානව අයිතිවාසිකම් (කැමති ආගමක් වැළඳගැනීමට ඇති අයිතිය, කැමති ආගමික චාරිත්‍රයක් පිළිපැදීමේ අයිතිය) අහිමි වන ආකාරයේ නීති පැවතීම

- කිසියම් ආගමික ව්‍යුහයක් විසින් අධිකරණ හෝ විධායක හෝ අනෙකුත් පාලන බලතල ක්‍රියාත්මක කිරීම

- හුදෙක් ආගමික මත අනුව පමණක් වැරදි වන ක්‍රියා සඳහා අපරාධ වැරදි සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරයෙන් කටයුතු කෙරෙන නීති පැවතීම

2. ආගමික නීතියක් ක්‍රියාත්මක කිරීමක් යැයි හැඟෙන ආකාරයේ කිසියම් හෝ ක්‍රියාකාරකමක්, ශාරීරික වධහිංසාවක්, බලකිරීමක් සිදුකිරීම, සහය දීම, අනුබල දීම කැරළිකාරීත්වයක් ලෙස සැලකීමට සහ සුදුසු දඬුවම් ලබාදිය හැකි නීතියක් සම්මත විය යුතු ය. (නැගෙනහිර පලාතේ හිටපු කාතිවරයා අනාචාරය වරදට කසපහර 100/110 දඬුවම් ලබා දී ඇති බවත් ඔහු පැවසූ බවත් මෙවැනි දඬුවම් කිරීම් මුස්ලිම් දේවස්ථාන කමිටු මගින් ප්‍රජා මට්ටමින් සිදුකර ඇති බව ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා මගින් දැනගත් බවත් හිෂානා හමීන් සහ හසනා සේගු ඉසදීන් විසින් ලියන ලද Unequal Citizens: Muslim womens’ struggle to justice and equality නම් අධ්‍යයනයේ සඳහන් වේ. (ඉංග්‍රීසි පිටපතේ 27 පිටුව)

ඒ සඳහා ආධාර කරන, අනුබලයක් වන සංවිධාන, මතවාද, දර්ශන, අර්ථනිරූපණ, පොතපත, වෙබ් අඩවි ඇතුලු අන්තර්ජාල මූලාශ්‍ර තහනම් විය යුතු ය. එවැනි තහනම් යැයි නම් කළ මූලාශ්‍රයක් ශාස්ත්‍රීය කටයුත්තක් සඳහා හැර සන්තකයේ තබාගැනීම, සමාජයට මුදාහැරීම, ප්‍රතිනිර්මාණය කිරීම සිදුකරන අය ද මේ වරද සඳහා

වරදකරුවන් ලෙස සැලකිය යුතු ය. මෙවැනි කටයුතුවල නියුතු ආගමික ස්ථාන වෙතොත් එම ස්ථාන වසා දමා, පූජකවරුන් රටින් නෙරපිය යුතු ය.

## ඍ) වෙනත්

### ඔම්බුඩ්ස්මන්වරයා

පාර්ලිමේන්තුවේ සහභාගීත්වයකින් තොර ව මහජනයාට සිය පෙත්සම් සෘජු ව ඔම්බුඩ්ස්මන්වරයා වෙත යැවිය හැකි පරිදි මෙම පටිපාටිය සංශෝධනය කරන්නේ නම් මැනවි. ස්වීඩනයේ පවතින ඔම්බුඩ්ස්මන් ධූරය සම්බන්ධයෙන් එහි මහජනයාට මේ හැකියාව පවතී. එමෙන් ම ඔම්බුඩ්ස්මන්වරයාගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පාර්ලිමේන්තුව බැඳී සිටින ලෙස ද විධිවිධාන සලස්වන මෙන් ඉල්ලා සිටිමු.

හේතුව:

> රජයේ නිළධරයන්ගේ හෝ ආයතනවල ක්‍රියා මගින් සිදුවන අකටයුතුකම් ගැන පැමිණිළි කර සහන නිර්දේශ කිරීමට ඔම්බුඩ්ස්මන් ධූරයක් ඇති කර ඇතත් කරුණු දෙකක් විසින් එහි ප්‍රතිඵල මහජනයාට නිසි අයුරින් ලබා ගැනීම දුෂ්කර වී තිබේ. එනම්,
>
> 1. ඔහු වෙත සිය පැමිණිළි සෘජු ව ඉදිරිපත් කිරීමට මහජනයාට නො හැකි වීමත්
> 2. ඔහු විසින් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පාර්ලිමේන්තුව බැඳී නො සිටීමත් ය.
>
> දැනට පවතින තත්ත්වය අනුව ඔම්බුඩ්ස්මන්වරයාට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට නම් අදාල පුරවැසියාට එය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලවා සහාගත කරවා ගැනීමට සිදුවන අතර මහජන පෙත්සම් කාරක සභාව එය ඔම්බුඩ්ස්මන්වරයාට යැවිය යුතු යැයි තීරණය කළ හොත් පමණක් එය ඔහු වෙත යවනු ලැබේ. මේ ආකාරයෙන් පෙත්සමක් සම්මත කරවා ගැනීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ සහය ලබාගැනීමට සාමාන්‍ය පුරවැසියකු දුෂ්කර බව අමුතුවෙන් කිව යුතු නොවේ. අනෙක් අතට මහජන පෙත්සම් කාරක සභාව ඔම්බුඩ්ස්මන්වරයාට යැවිය යුතු බවට තීරණය කිරීම ද ඉතා අවිනිශ්චිත ය.

### ද්විත්ව පුරවැසිභාවය

පාර්ලිමේන්තු මන්ත්‍රී, ජනාධිපති, අමාත්‍යාංශ ලේකම්, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන ප්‍රධානීන්, උපරිමාධිකරණ විනිසුරන්, නීතිපති, හමුදා ප්‍රධානීන්, පොලිස්පති, විගණකාධිපති, මහබැංකු අධිපති වැනි සියලු ම උසස් තනතුරු සඳහා පත්වන්නන් මෙරට පමණක් පුරවැසිභාවය හිමි අය විය යුතු බවට ප්‍රතිපාදනයක් ඇතුළත් කරන මෙන් ඉල්ලා සිටිමු. ජාත්‍යයන්තර තරගවලට සහභාගී වන ක්‍රීඩකයන් ද මෙයට ඇතුළත් විය යුතු බව හිටපු මහාචාර්ය නලින් ද සිල්වා ලියා තිබුණි.

**මෙහි මහජන අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ අරමුණින් කර ඇති සෑම යෝජනාවක් ම පාහේ හැකිනම් ජනමත විචාරණයකින් තොර ව වෙනස් කළ නොහැකි ලෙස පනවන්නේ නම් මැනවි!**

- සචින්ත මදුෂාන් (970531874 v)